**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජනවාරි 2016

## (AA21) උසස් මූල්‍ය ගිණුම්කරණය

(Advanced Financial Accounting)

---

## A - කොටස

(වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න)

(ලකුණු 20)

### ප්‍රශ්න අංක 01

A - කොටස අනිවාර්ය ප්‍රශ්න 06 කි. මේ සඳහා සම්පූර්ණ ලකුණු 20 කි. පිළිතුරු මගින්, ලාභ නොලබන ආයතන සම්බන්ධ ප්‍රාථමික දැනුම හා දායක මුදල් ගිණුම් ගතකිරීම කෙරෙහි දැනුම, එකතුකළ අගය මත බදු පිළිබඳ දැනුම, සමාගම් පනත පිළිබඳ දැනුම, හවුල්ව්‍යාපාර ආඥාපනත පිළිබඳ අවබෝධය, ණය සාධන පත්‍ර ස්කන්ධ සාධන පත්‍ර සමග සැසඳීමේ දී ඇති වෙනස්කම් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ආශ්‍රිත දැනුම විමසා ඇත.

දායක මුදල් ගිණුම් ගතකිරීම පිළිබඳ දැනුම විමසීමේ දී හිඟ සාමාජික මුදල් හා කලින් ලැබූ මුදල ගණනය කිරීම පිළිබඳ සමහර අයදුම්කරුවන්ගේ දැනුම ඉතා දුර්වල මට්ටමක පැවතුණි. බොහෝ පිරිසකට වර්ෂයට අදාල සාමාජික මුදල නිවැරදිව ගණනය කර ගැනීමට නොහැකි විය. වැඩි දෙනෙකුගේ හවුල් ව්‍යාපාර ආඥා පනත සම්බන්ධ දැනුම දුර්වලය. සමාගම් පනත සම්බන්ධ මූලික දැනුම ද සතුටුදායක නොවේ. බොහෝ අයදුම්කරුවන් ණය සාධන පත්‍ර, ස්කන්ධ සාධන පත්‍ර සමග සැසඳීමේ දී ඇති වෙනස්කම් නිවැරදිව හඳුනාගෙන නොතිබුණි. එකතුකළ අගය මත බදු දැනුම සම්බන්ධ ගැටළු විසඳීමේ දී ගැනුම් මත බදු හා විකුණුම් මත බදු(Input / Output Tax) දැනුම ඉතා දුර්වල අයදුම්කරුවන් ද විය. ගැනුම් මත බදු හා විකුණුම් මත බදු සැසඳීම නිවැරදිව සිදුකර නොතිබුණි. බදු පියවීම සහ ගෙවිය යුතු බදු නිවැරදිව හඳුනාගෙන නොතිබුණි. පිළිතුරු නොදුන් අයදුම්කරුවන් ද විය. තොග පිරිවැය සූත්‍ර සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත දැනුම ඉතා දුර්වල මට්ටමක පැවතුණි. ඒ සම්බන්ධයෙන් යොමුව තිබූ 1.6 ප්‍රශ්නයට නිවැරදි පිළිතුර සපයා තිබුණේ අතලොස්සකි.

## B කොටස

(එකකට ලකුණු 5 බැගින් අනිවාර්ය ප්‍රශ්න 5 කි)

(මුළු ලකුණු 25)

### ප්‍රශ්න අංක 02

සංශෝධිත ගෙවිය යුතු පාලන ගිණුම හා වෙළඳ ගෙවිය යුතු පාලන ගිණුමේ සංශෝධිත ශේෂය, ගෙවිය යුතු උප ලෙජරයේ පෞද්ගලික ගිණුම් ශේෂ ලැයිස්තුවේ එකතුව සමග සැසඳීමේ ප්‍රකාශනය පිළියෙල කිරීම සඳහා යොමු කළ ප්‍රශ්නයකි. සංශෝධිත වෙළඳ ගෙවිය යුතු පාලන ගිණුම සමග පෞද්ගලික ගිණුම් ශේෂ ලැයිස්තුවේ එකතුව සැසඳීම නිවැරදිව පිළියෙල කර සාර්ථක ලකුණු ලබා ගැනීමට වැඩි දෙනෙක් අසමත් විය. පාලන ගිණුමේ ශේෂ සැසඳීම සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් අයදුම්කරුවන්ට නොවීය. ලෙජර් ගිණුම් පිළියෙල කරන ලෙසට සටහන් කර ඇතත් ජර්නල් සටහන් ඉදිරිපත් කර තිබිණි. වෙළඳ ගෙවිය යුතු පාලන ගිණුමට හර කළයුතු ගනුදෙනු බැර පැත්තේත්, බැර කළ යුතු ගනුදෙනු හර පැත්තේත් ඇතැම් අයදුම්කරුවන් සටහන් කර තිබිණ. අයදුම්කරුවන්ගේ දැනුම පොදු ලෙජරයේ වෙළඳ ගෙවිය යුතු පාලන ගිණුම හා ගෙවිය යුතු ලෙජරයේ ණයහිමි ගිණුමට (Individual A/C) පමණක් සීමා වීම නිසා ගිණුම් ශේෂ සැසඳුම් ප්‍රකාශය ගිණුම් ස්වරූපයෙන් ඉදිරිපත් කර තිබුණි.

## ප්‍රශ්න අංක 03

ගළපන ලද මුදල් පොත සහ බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කරන ලෙස යොමු වූ ප්‍රශ්නයකි. මේ සඳහා ලකුණු 05 ක් වෙන්කර තිබුණි. වැඩි දෙනෙක් මුළු ලකුණු උපයා ගෙන තිබුණි. මෙය සාම්ප්‍රදායික ස්වරූපයෙන් බැහැරව න්‍යායික දැනුම විමසමින් යොමු කළ ප්‍රශ්නයකි. සියළු සටහන් ඇතුලත් බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමට වැඩි දෙනෙක් යොමු වී තිබිණ. එහෙයින් ගළපන ලද මුදල් පොතට වෙන්කල ලකුණු අහිමි වන ලදී. ඇතැම් අයදුම්කරුවන් සම්පූර්ණ මුදල් පොත ම පිළියෙල කිරීම අනවබෝධයෙන් සිදු කර තිබුණි.

මුදල් පොතේ ශේෂය ගළපා නිවැරදි ශේෂය, බැංකු සැසඳුමට ගෙන ඒම වැඩි දෙනෙක් සිදුකර නොතිබුණි. ඒ වෙනුවට එම ගැළපීම් බැංකු සැසඳුම් ප්‍රකාශය තුල ම දක්වා තිබුණි. නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් හි අගය මුදල් පොතේ ශේෂයට එකතු කිරීම ද, තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් වල අගය අඩු කිරීමද නොකළ අයදුම්කරුවන් බොහෝමයක් විය. තම මට්ටමට ගැළපෙන මූලික න්‍යායික දැනුම තහවුරු කර ගෙන නොතිබූ අයදුම්කරුවන් පිරිසක් ද විය. සමස්ථ මුළු ලකුණු ලබාගත් අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව ඉතා ඉහළ මට්ටමක විය.

## ප්‍රශ්න අංක 04

වැටුප් සම්බන්ධ ජර්නල් සටහන් ඉල්ලා ඇතත් ඇතැම් අයදුම්කරුවන් ලෙජර් ගිණුම් ඉදිරිපත් කර තිබුණි. තවත් කොටසක් ජර්නල් සටහන් සහ ලෙජර් ගිණුම් ඉදිරිපත් කරමින් අනවශ්‍ය ලෙස කාලය මිඩංගු කර තිබුණි. සේවක අර්ථසාධක අරමුදල් සම්බන්ධයෙන් සේවා යෝජකයා ගේ දායකත්වය හා සේවක භාර අරමුදලට දායකත්වය ඇතැම් අයදුම්කරුවන් විසින් ශුද්ධ වැටුප මත ගණනය කර තිබුණි. එක් එක් අරමුදලේ දායකත්ව ප්‍රතිශතයන් නිවැරදිව නොදන්නා අයදුම්කරුවන් ද විය. සමහර අයදුම්කරුවන් නිවැරදිව හර සටහන් සහ බැර සටහන් හඳුනා නොගෙන ජර්නල් සටහන් පිළියෙල කර තිබුණි. ප්‍රශ්නය නිසි පරිදි කියවා අවබෝධ කර නොගෙන පිළිතුරු සැපයීම මූලික දුර්වලතාවය විය.

## ප්‍රශ්න අංක 05

හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් හා ප්‍රාග්ධන ගිණුම් තීරු ක්‍රමයට පිළියෙල කිරීම අවශ්‍ය විය. සුළු අයදුම්කරුවන් සංඛ්‍යාවක් මුළු ලකුණු ලබා ගැනීමට සමත් විය. විශ්‍රාම ගන්නා හවුල්කරුගේ කොටස (ශේෂය) ජංගම ගිණුමෙන් ප්‍රාග්ධන ගිණුමට මාරුකර නිවැරදිව ගළපා නොතිබුණි. ප්‍රත්‍යාගණන ලාභය නිවැරදිව ගණන් බැලීමට හා නිවැරදි ලාභය ගළපා හවුල්කරුවන් අතර නිවැරදි අනුපාතයට බෙදා පෙන්වීමට අදාල ලකුණු ලබා ගැනීමට වැඩි දෙනෙක් සමත් වී නොතිබුණි. කීර්තිනාම ගැළපීම බොහෝ අයදුම්කරුවන් නිවැරදිව සිදුකර ඇතත් අනවබෝධය නිසා ගණනය කරන ලද කීර්තිනාමය "ගිණුම් පොත්වල පෙන්නුම් නො කිරීමට හවුල්කරුවෝ තීරණය කර ඇති බැවින්.." කිසිදු සටහනක් නොතැබූ අයදුම්කරුවන් පිරිසක් ද විය. කීර්තිනාම ගැළපීම හා ප්‍රත්‍යාගණන ලාභය ජංගම ගිණුමෙහි සටහන් කළ අයදුම්කරුවන් ද බොහෝ පිරිසක් විය.

## ප්‍රශ්න අංක 06

හවුල් ව්‍යාපාරයේ ලාභා'ලාභ විසර්ජන ගිණුම පිළියෙල කිරීමෙන් මෙම ලකුණු 05 ලබා ගත හැකිව තිබුණි. හවුල් ව්‍යාපාර සම්බන්ධ මූලික ගැටළු පිළිබඳ දැනුම පරීක්ෂාවට යොමු කළ මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් මුළු ලකුණු ලබා ගැනීමට සමත්ව තිබුණි. හවුල් ගිවිසුමට අනුව ලාභා'ලාභ විසර්ජනය පිළිබඳවත් ප්‍රාග්ධන පොලී සහ ගැනිලි පොලී සම්බන්ධ අවධානය යොමු කරමින් ගැටළුව ඉදිරිපත් කර තිබුණි.

ලාභා'ලාභ විසර්ජන ගිණුමට, ප්‍රාග්ධන ගිණුම් ශේෂ, ජංගම ගිණුම් ශේෂ හා ගැනිලි ද ඇතුලත් කළ අයදුම්කරුවන් ද විය. ගැනිලි පොලී ලාභා'ලාභ විසර්ජන ගිණුමේ වියදමක් ලෙස හර කළ අවස්ථා ද විය. ශුද්ධ ලාභයට සිදුකරන එකතු කිරීම් හා අඩු කිරීම් පිළිබඳ නිවැරදි අවබෝධයක් ඇතැම් අයදුම්කරුවන්ට නොමැති බව විද්‍යාමාන විය. පොලී නිවැරදිව ගණනය නොකළ අවස්ථා ද විය. ප්‍රශ්නයෙන් ඉල්ලා නොමැති ජංගම ගිණුම් හා ප්‍රාග්ධන ගිණුම් ද පෙන්වීමට ඇතැම් අයදුම්කරුවන් කාලය මිඩංගු කර ඇත.

## C කොටස

(එකකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 3 කි)

(මුළු ලකුණු 30)

### ප්‍රශ්න අංක 07

හවුල් ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශය හා ලාභා'ලාභ විසර්ජන ගිණුම පිළියෙල කිරීම සඳහා මෙම ප්‍රශ්නය යොමුකර තිබුණි. මෙය වැඩි දෙනෙක් පිළිතුරු සපයන ලද ප්‍රශ්නයකි. මුළු ලකුණු ලබාගැනීමට ද වැඩි දෙනෙක් සමත් විය. ඇතැම් අයදුම්කරුවන් ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීමේ දී නිවැරදි ආකෘතිය වෙනුවට 'T' ගිණුම යොදා ගෙන තිබුණි. විසර්ජන ගිණුමේ පෙන්විය යුතු හවුල්කරුගේ වැටුප් ලාභා'ලාභ ගිණුමේ ද ගළපා තිබුණි. අනවශ්‍ය ගිණුම්, එනම් ප්‍රාග්ධන ගිණුම්, ජංගම ගිණුම් හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශ ආදිය ද ඉදිරිපත් කිරීමට වටිනා කාලය වැය කර තිබුණි. ප්‍රශ්නය කියවා බලා තේරුම් නොගැනීම නිසා මෙසේ කාලය වැය කර තිබුණි.

### ප්‍රශ්න අංක 08

කේවලස්වාමි ව්‍යාපාරයක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම සඳහා මෙම ප්‍රශ්නය යොමුවී ඇත. ප්‍රශ්නය කියවා අවබෝධ කර නොගෙන පිළිතුරු සපයා තිබුණි. අවශ්‍ය පෙරවැඩ නොපෙන්වීම නිසා ලකුණු අහිමි විය. මුළු ලකුණු ලබාගත් ප්‍රතිශතය අවම මට්ටමක පැවතුණි. ඇතැම් අයදුම්කරුවන් පිළිතුරු සැපයීමට උත්සාහ නොකළ ප්‍රශ්නයකි. තොග පිළිබඳ ශුද්ධ උපලබ්ධි අගය හා වත්කම් ඉවත් කිරීමේ ලාභ ගණනය සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමුකළ යුතුව ඇතත් අදාල සටහන් හෝ පෙරවැඩ පෙන්වීමට හෝ අයදුම්කරුවන් උත්සාහ කර නොතිබුණි. එහෙයින් අදාල ලකුණු අහිමි විය.

### ප්‍රශ්න අංක 09

ක්‍රීඩා සමාජයක වර්ෂය අවසානයේ ආදායම් හා වියදම් ගිණුමත්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයත් පිළියෙල කිරීම සඳහා මෙම ප්‍රශ්නය යොමු වී තිබුණි. සමිති සමාගම්හි ගිණුම් පිළියෙල කිරීම සම්බන්ධ දැනුම දියුණු කරගත යුතු වේ. පිළිතුරු සපයන ලද අයදුම්කරුවන් විසින් ලබාගත් ලකුණු මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. ආරම්භක ශේෂ හඳුනා ගනිමින් ක්ෂය ගණනය කිරීම් නිවැරදිව පෙන්වීමට ඇතැම් අයදුම්කරුවන් සමත්වී නොතිබුණි. දායකත්ව මුදල් ප්‍රමාණය ගණනය කිරීම සරල වුවත් නිවැරදිව පෙන්වීමට අයදුම්කරුවන් බහුතරයක් අසමත්ව ඇත. පෙරවැඩ පැහැදිලිව ඉදිරිපත් කර නොතිබූ බැවින් නිවැරදි නොවන ගැළපුම් සඳහා ලකුණු අහිමි වන ලදී.

## D කොටස

(අනිවාර්ය ප්‍රශ්නයකි)

(ලකුණු 25)

### ප්‍රශ්න අංක 10

සමාගම් සම්බන්ධයෙන් කළමනාකරණයේ භාවිතය සඳහා වර්ෂය අවසානයේ ආදායම් ප්‍රකාශය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කිරීම සඳහා වූ මෙම ප්‍රශ්නයට ලකුණු 25ක් වෙන්කර තිබුණි. ගනුදෙනුකරුවෙක් සම්බන්ධයෙන් ඇතිව ඇති බොල්ණය හා අඩමාන ණය ගැටළු, උපචිත වියදම්, වත්කම් ක්ෂය ගණනය, ආදායම් බදු ගැලපීම සහ හිමිකම් නිකුතුවක් සම්බන්ධ ගැටළු ආදිය ඇතුලත් කර ඒවා ගිණුම් තැබීම සම්බන්ධයෙන් මෙම ප්‍රශ්නය මගින් අවධානය යොමු කර තිබුණි. අයදුම්කරුවන් බොහොමයක් දෙනා මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබුණි. ඇතැම් අයදුම්කරුවන් විසින් කොටස් හිමියන්ට ඉදිරිපත් කෙරෙන ආකාරයට ගිණුම් පිළියෙල කර තිබුණි. නියමිත ආකෘතියට, රටාවට අනුව පිළිතුරු ලිවීමට අයදුම්කරුවන් බහුතරයක් උත්සාහ කර තිබුණි. මුළු ලකුණු ලබාගැනීමට ද ඇතැම් අයදුම්කරුවන් සමත් විය. සමස්ථයක් වශයෙන් සමාගම් ගිණුම් පිළිබඳ දැනුම විමසීමට උචිත අයුරින් ගැටළුව ඉදිරිපත් කර තිබුණි.

ආයතන හා පරිපාලන වියදම් යටතට ගැනෙන අයිතමයන් නිවැරදිව හඳුනාගැනීමට බොහෝ අයදුම්කරුවන් අසමත්ව ඇත. ඒ අනුව ලකුණු ලබාදීම ඉතා අසීරු විය. කෙසේවෙතත් පෙරවැඩ ලෙස ඒවා පෙන්වූ අයදුම්කරුවන් නියමිත ලකුණු රැස්කර ගැනීමට සමත් විය. ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳ මූලික දැනුම නොමැතිවීම අයදුම්කරුවන්ගේ පොදු දුර්වලතාවයක් විය. ලාභාංශ ගැලපුම නිවැරදිව සටහන් කර නොතිබුණි. උපචිත වියදම් ගැලපුම් විසඳීමේ දී හර, බැර සටහන් පිළිබඳ මූලික අවබෝධය අයදුම්කරුවන් ට තිබිය යුතුය. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට අදාල සටහන් හා ආදායම් ප්‍රකාශයට අදාල සටහන් නිසි පරිදි ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතු ය. අදාල ගැළපුම් නිසි ස්ථානයේ නිවැරදිව දැක්වීමට අවබෝධය ලබාගත යුතුය. පෙරවැඩ නිවැරදිව සිදු කර ආදායම් ප්‍රකාශයේ අවශ්‍ය අගය නිසි පරිදි පෙන්වූ අයදුම්කරුවන් සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට සමත් වූහ. හිමිකම් නිකුතුව සම්බන්ධයෙන් අවධානය යොමු නොකළ අයදුම්කරුවන් ද විය. ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයක් ඉල්ලා නැතත් අයදුම්කරුවන් එයද ඉදිරිපත් කර තිබුණි. මූල්‍ය තත්ත්වය වෙනස්වීමේ ප්‍රකාශය ඉල්ලා නැතත් සමහර අයදුම්කරුවන් එය ද ඉදිරිපත් කිරීමට පෙළඹීමෙන් කාලය කළමනාකරණය පිළිබඳව සැලකිලිමත් වී නොමැති බව දක්නට ලැබුණි.

තවදුරටත් අයදුම්කරුවන් විසින් මූලික ගිණුම්කරණ මූලධර්ම, නව ගිණුම්කරණ ප්‍රමිත, නව සමාගම් පණත පිළිබඳව අවබෝධය ප්‍රගුණ කර ගත යුතු ය. ප්‍රශ්න වලට පිළිතුරු ලිවීමේ දී ප්‍රශ්න අංක නිවැරදිව යෙදීම, පිළිතුර ආසන්නයෙන් ම අදාල පෙරවැඩ පෙන්වීම හා ප්‍රශ්නයේ කොටස් තැනින් තැන වෙනත් පිටුවල පෙන්වීමෙන් වැළකීම ප්‍රශ්නයට හිමි ලකුණු සියල්ල ලබා ගැනීමට මහත් රුකුලක් වනු ඇත.

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

1. නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.
2. නව LKAS ප්‍රමිත සම්බන්ධ දැනුම තව දුරටත් වර්ධනය කර ගත යුතුය.
3. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.
4. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.
5. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ යුතුය.
6. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.
7. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.
8. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

\- * * * -